# පෞරුෂ සංවර්ධනය

කළුබෝවිටියන සෝරත හිමි

## පෞරුෂය හැඳින්වීම

පෞරුෂය යනු පුද්ගලයෙකුගේ ශාරීරික, මානසික, සදාචාරාත්මක හා සමාජීය ගුණයන් ඵලදායි ආකාරයකට ඒකාබද්ධ ලෙස සංවිධානය වී අවශේෂ පුද්ගලයන්ට ප්‍රදර්ශනය වන ආකාරයයි. එසේ පුද්ගලයෙකු තුළ පවත්නා සහජ හෝ පසුව අවශෝෂණය කරගත් හැඟීම්, ආවේග, පුරුදු, ආශා, අපේක්ෂා මෙයට සම්බන්ධ වේ. පෞරුෂ සංවර්ධනය එක් එක් පුද්ගලයාගෙන් වෙනස් වේ. විවිධ පෞරුෂ ලක්ෂණ පාදක කොට ගෙන පෞරුෂ වර්ග කිහිපයක් වර්ග කොට ඇත. පෞරුෂ වර්ගයක් යනු අවට ලෝකය සමග අන්තර් ක්‍රියා දැක්වීමේ දී එක් රටාවක් ලෙස විස්තර කළ හැකි ය. ඍණාත්මක හෝ ධනාත්මක වශයෙන් පුද්ගලයා තුළ පෞරුෂ වර්ධනය ඇති වේ. පෞරුෂ වර්ධනය පිළිබඳ ජෛවමය, සමාජ ඉගෙනුම්, මනෝ විශ්ලේෂණවාදී වශයෙන් පිවිසුම් තුනක් දැකිය හැකි ය.

## පෞරුෂ සංකල්පය

පෞරුෂය පිළිබඳ පැහැදිලි නිර්වචනයක් කිරීම බෙහෙවින් අපහසු කාර්යයකි. එහෙත් මේ සම්බන්ධයෙන් පවත්නා පොදු භාවිතයන් ඇසුරෙන් ඒ පිළිබඳ ව කිසියම් අදහසක් ඇති කර ගැනීම දුෂ්කර නොවේ. පෞරුෂත්වය මේ යැයි අවසාන වශයෙන් නිගමනය කළ නොහැක. ගෝඩ්න් ඕල්පෝට් පෞරුෂය ගැන කරුණු දක්වමින් නිර්වචන 50 ක් පමණ පවතින බව දක්වා ඇත. පෞරුෂත්වය පිළිබඳ අගනා ග්‍රන්ථයක් සකස් කළ ඕල්පෝට් එය විස්තර කරන්නේ මෙසේ ය.

"පෞරුෂත්වය යනු පුද්ගලයා තුළ ඇති කායික සහ මානසික ජීවිතය පරිසරය අනුව හැඩගැසී ඇති ආකාරයයි. පුද්ගලයාගේ පෞද්ගලික භාවය විශේෂයෙන් දක්නට ලැබෙන්නේ මානසික හා චිත්තවේගීය මාර්ගයන්ගෙනි. ඔහුගේ චරිතමය ගති-පැවතුම්, අදහස්

උදහස් ආකල්පයන් ආශාවන් සහ ඔහුගේ චරිතමය සහ ජීවිතමය දර්ශනය ද මනෝවිද්‍යාත්මක පෞද්ගලිකත්වය පෙන්නුම් කරයි."

පෞරුෂය සඳහා සුදුසු නිර්වචනයක් සැපයීම සම්බන්ධයෙන් මනෝවිද්‍යාඥයන් අතර පවා මතභේද පවතී. පෞරුෂය යන්නෙන් මනෝවිද්‍යාඥයන් අදහස් කරන්නේ පුද්ගලයින් හැසිරෙන සුවිශේෂ ආකාරය පිළිබඳ ව තේරුම් ගැනීමයි. පුද්ගලයින් එකිනෙකාගෙන් වෙන් කර දැක්වීම සඳහා පෞරුෂය උපකාරී වන බවත් එම පෞරුෂ රටාවන් අනුව සිදුවන චර්යාව ඇසුරෙන් හැම පුද්ගලයෙකු ම සුවිශේෂ කෙනෙකු බවට පත්වන බවත් මෙහිදී අවධාරණය කෙරේ.

- ඕල්පොට් (ALLPORT) ගේ නිර්වචනය

"පුද්ගලයාගේ විශේෂ වූ චර්යාව සහ චින්තනය නියත කරන පුද්ගලයෙකු තුළ වූ මනෝ භෞතික පද්ධතීන් ගේ ගතික සංවිධානය පෞරුෂය නම් වේ."

(I) සංවිධානය (II ) ගතික (III) මනෝ භෞතික පද්ධතීන් (IV) චර්යාව සහ චින්තනය නියත කරන මෙම නිර්වචනයට අනුව පෞරුෂය සංවිධානාත්මක දෙයක් වශයෙන් හඳුන්වා ඇත. මෙය දීර්ඝ කාලයක් තුළ ගොඩනැගෙන්නකි. මෙම විග්‍රහයට අනුව කෙනෙකුගේ පෞරුෂය උත්පත්තියේ සිට මරණය දක්වා ම සංවිධානය වීමට ඉඩ ඇත්තේ ය. පෞරුෂය වෙනස්කම්වලට භාජනය විය හැකි ය. පුද්ගලයා ජීවත් වන පරිසරයේ ඇතිවන වෙනස්කම් වයස් මට්ටමේ වෙනස්කම් ආදිය නිසා පෞරුෂයේ වෙනස්කම් ඇති වේ. පෞරුෂය කෙනෙකුගේ මානසික හා භෞතික ක්‍රියාකාරීත්වය සමග ඍජුව සම්බන්ධ වේ. පෞරුෂය කෙනෙකුගේ චර්යාව හා චින්තනය නියත කරන ප්‍රබල සාධකයකි.

ඇතැම් අය බාහිරව පෙනෙන චර්යාව අනුව පෞරුෂය විග්‍රහ කරලීමට උත්සාහ ගෙන ඇත. පෞරුෂත්වය යන්න සංකල්පීය නිර්මිතයක් ලෙස සැළකේ. පෞරුෂත්වය විද්‍යමාන නොවන නමුත් කෙනෙකුගේ සිතුම් පැතුම් අතරින් ඔහුගේ චර්යාව දැන ගැනීමෙන් කෙනෙකුගේ චරිතය පූර්ව කථනය කළ හැකි ය. මනෝවිද්‍යාඥයන් පෞරුෂය පිළිබඳ සිදුකර ඇති පොදු නිර්වචනය වන්නේ "අන් අය

ඔබ කෙරෙහි අවධානය යොමු කරලීමේ දී පවත්නා පෞරුෂය ලෙස පිළිගත් බවය." විද්‍යාත්මක ලෙස පෞරුෂය සංකල්පය පිළිබඳ ව කරුණු අනාවරණය කර ඇත. 1919 දී ජේ. කෙම්ප් විසින් පෞරුෂය මෙසේ නිර්වචනය කර ඇත. "සිරිත් පරිදි ඇතිකර ගත් සැකසීම එයට ම අදාළ ආත්ම කේන්ද්‍ර ප්‍රේරණ සහ පරිසරයේ අවදානමිත යන අංශ දෙක අතර ඇතිවන ජීව වස්තූන්ගේ බලයන් පෞරුෂත්‍ව යයි." පෞරුෂය යනු පුද්ගලයාගේ සමස්ත සංවර්ධනය යි. මෙහිදී ආරම්භය වශයෙන් පුද්ගලයා තුළ ඇතිවන දේහ විද්‍යාත්මක (ජෛව සංස්ථිතය) බෙහෙවින් වැදගත් වේ. එමෙන් ම පුද්ගලයාගේ දැනුම ප්‍රඥා හොඳින් දියුණු විය යුතු ය. මේ සමග ම පුද්ගලයා සමාජයට කැපී පෙනෙන සමාජය අවනත කරගත හැකි සමාජශීලි සමාජය පිළිගන්නා ප්‍රසන්න කෙනෙකු විය යුතු ය. සමබර පෞරුෂ ගුණාංග ලෙස පහත දෑ දැක්විය හැකි ය.

- තමන්ට වාසිදායකය
- පවුලට වාසිදායකය
- පරිසරයට වාසිදායකය
- තම ක්ෂේත්‍රයට වාසිදායකය

පෞරුෂ ගුණ ධර්ම ජීවිතය තුළ සංවර්ධනය කරගැනීම මගින් එහි ප්‍රතිඵලය තමාට වාසිදායක ය. තමා තුළ පෞරුෂ ගුණ ධර්ම පැවතීම කීර්තිය ප්‍රශංසාව වර්ධනයට සේ ම ආත්මානුගතව ද එය ජීවිතයට සම්බන්ධ වේ. එමෙන්ම පෞරුෂ සංවර්ධනය තම පවුලට ද වාසිදායක ය. තම පවුලට අභිමානය, කීර්තිය ආදිය ලැබීමටත් සමාජ ගෞරවය ලැබීමටත් ප්‍රධාන සාධකයකි. තම පෞරුෂ සංවර්ධනය තමා වාසය කරන සමාජ පරිසරයට බෙහෙවින් වාසිදායක ය. සමාජය සාමකාමී ස්ථානයක් වීමට සංවර්ධිත ස්ථානයක් වීමට පෞරුෂ සංවර්ධිත පුද්ගලයන් සිටීම සැමදාට වටිනා කාරණාවකි.

පෞරුෂ සංවර්ධනය මනෝවිද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක විග්‍රහ අනුව පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකුගෙන් වෙනස් වන, ඔහුටම ආවේණික වූ, සමාජීය ජීවිතය තුළ ඔහු වෙතින් ප්‍රකට

කෙරෙන සුවිශේෂී චර්යාවන් සමුදාය පෞරුෂය ලෙස සරලව හඳුන්වා දිය හැකි ය. දෘශ්‍යමාන සමාජය තුළ පුද්ගල චරිත විවිධාකාර වනවා සේ ම පුදුමාකාර ය. විවිධ සමාජ භූමිකාවන් රංගනය කරන පුද්ගලයා අවස්ථාවන්ට මුහුණ දීමේ දී හා පරිසරය හා ගැටීමේ දී මෙසේ විවිධ චර්යාවන්, සිතිවිලි හා භාවමය ප්‍රතිචාරයන් දක්වන්නේ කෙසේද? පුද්ගලයා සමාජය තුළ සුවිශේෂී අයෙකු බවට පත් කරන පෞරුෂය ඇති වන්නේ කෙසේද? එය වර්ධනය වන්නේ කුමන සාධකවල බලපෑම මතද? එහි විපර්යාසයන් කවරේද? විශේෂයෙන් ම කුඩා ළමයෙකු අවුරුදු පහ පමණ වන විට ඔහුගේ පෞරුෂය සම්බන්ධ මූලික ගුණාංග ගොඩනැගී හමාර වන බව ශ්‍රේෂ්ඨ මනෝවිද්‍යාඥ සිග්මන් ෆ්‍රොයිඩ් පෙන්වා දෙයි. ඇල්බට් බන්ඩුරා වැන්නන්ට අනුව එය සමාජ ඉගෙනුම් ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. මෙවැනි මනෝවිද්‍යාඥයන්ගේ ප්‍රධාන න්‍යායයන් කිහිපයක් ඇසුරු කර ගනිමින් උක්ත පැනවලට විසඳුම් සෙවීම මෙහි මූලික අරමුණයි. එය ඔබගේ පෞරුෂය නිර්වචනය කිරීමට, අවබෝධ කර ගැනීමට මෙන්ම සකස් කර ගැනීමට ද පිටුවහලක් වනු ඇත.

**පෞරුෂ සංවර්ධනය පිළිබඳ මනෝවිශ්ලේෂණවාදී ප්‍රවේශය**

පෞරුෂ සංවර්ධනය පිළිබඳ මනෝවිශ්ලේෂණවාදී ප්‍රවේශයේ පෞරුෂය ගොඩනැගීම හා වර්ධනය සම්බන්ධයෙන් අවිඥානික මනස පිළිබඳ වඩා වැදගත්කමක් යොමු කරන මනෝවිශ්ලේෂණවාදයේ ආරම්භකයා සිග්මන් ෆ්‍රොයිඩ් ය. ඔහුගෙන් පසු කාල් යුංග්, ඇල්ෆ්‍රඩ් ඇඩ්ලර් වැනි අය එය දියුණු කළහ. වියානාවේ ස්නායුවේද වෛද්‍ය වෘත්තිකයෙකු වූ සිග්මන් ෆ්‍රොයිඩ් දශක කිහිපයක් තිස්සේ මානසික රෝගීන් ඇසුරෙන් ලද අද්දැකීම්වල ප්‍රතිඵලයක් ලෙස පෞරුෂ වර්ධනය පිළිබඳ නවතම මතවාදයක් ක්ෂේත්‍රයට එක් කළ අසහාය පුද්ගලයෙකි. මූලික වශයෙන් ම ඔහු පුද්ගල මනසෙහි ස්ථර තුනක් ඇති බව පෙන්වා දෙයි. එනම්, සවිඥානික සිත (conscious mind), උපවිඥානික සිත (Sub Unconscious mind), අවිඥානික සිත (Unconscious mind) යන තුනයි. මිනිස් සිතෙහි පිටතට විවෘත වූ කොටස වන්නේ සවිඥානික සිතයි. අප මේ අවස්ථාවෙහි සිතන පතන දෑ සහ සංජානනයන්, බුද්ධිය ආදිය මෙහෙයවනුයේ සවිඥානය විසිනි. මනසෙහි දෙවන ස්ථරය වන උපවිඥානයෙහි ඇත්තේ අතීත

මතකයන්, දැනුම ආදිය යි. වරක් සවිඥානයෙහි පැවති හා නැවත අවශ්‍ය විට සවිඥානයට ගත හැකි මතකයන් මෙහි පවතියි. පෞරුෂය ගොඩනැගීමෙහි ලා ඉතා වැදගත් කොට ඔහු පෙන්වා දෙනුයේ අවිඥානික මනසයි. මනසෙහි සැඟවුණු ස්ථරය වන මෙහි පවතිනුයේ අවරෝධනය කරන ලද ආශයන්, ඉටුකළ නොහැකි කාමාශාවන්, ආක්‍රමණශීලී ප්‍රේරණයන්, ලිංගික ප්‍රේරණයන් හා චිත්තවේග ආදියයි. මෙම අවිඥානික සිතිවිලි පුද්ගලයා නොදැනුවත්වම පාහේ පෞරුෂය කෙරෙහි බලපාන බව ෆ්‍රොයිඩ්ගේ අදහස යි.

ළමා වියේ සිට වූ භීතිකාවන්, දෙමව්පියන් වැනි යමෙකු පිළිබඳ ඇතිකරගත් එදිරිවාදිකම්, තරහව ආදිය මෙහි යටපත් ව තිබිය හැකි ය. වැඩිහිටියෙකු ලෙස සමාජයට එක් වීමේ දී ඔහුගේ පෞරුෂය හැඩගැසීමට එම සාධක ඍජුවම බලපාන බව පෙනේ. පෞරුෂයේ ව්‍යුහය පුද්ගලයෙකුගේ පෞරුෂය ප්‍රධාන වශයෙන් කොටස් තුනක් මත පදනම් වන බව ෆ්‍රොයිඩ් පවසයි. එනම් අහංභාවය (Id), අධි අහංභාවය (Ego), උපරි අහංභාවය (Super Ego) යන තුනයි. පුද්ගලයකුගේ චර්යාවට මූලික වන්නේ මෙම සාධක තුන බව ඔහු පෙන්වා දෙයි. Id පවතිනුයේ මනසෙහි අවිඥානික මට්ටමේ ය. සුඛ වේදනා මූලධර්මය (Pleasure principle) මත පදනම් ව ක්‍රියාත්මක වන මෙය ප්‍රාථමික ආශයන් මඟින් හසුරුවන බලවේග යයි. මිනිසාගේ මූලික ප්‍රේරණයන් වන නින්ද, කුසගින්න, ලිංගික ආශාවන්, අපද්‍රව්‍ය බැහැර කිරීම ආදි චර්යාවන්ට ජීවය සපයනුයේ මෙමඟිනි. පුද්ගල පෞරුෂය ගොඩනගන ප්‍රාථමික මූලයන් සහ මානසික ශක්තිය පවතිනුයේ Id තුළ ය. මන්ද යත්, උපතත් සමඟ ළදරුවෙකුගේ මනස අවිඥානයෙන් පමණක් සමන්විත වන හෙයින් සහ උක්ත ආශයන් ඉටු කර ගැනීමට ප්‍රබල ලෙස පොළඹවනුයේ මෙමගින් හෙයිනි. අහංභාවය Ego යනු යථාර්ථ මූලධර්මය මත පදනම් ව ක්‍රියා කරන්නකි. ඉඩ්ගේ ආශාවන්, ප්‍රේරණයන් තාර්කිකව සිතා බලා සමාජ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කොට සමබර කරනුයේ අහංභාවය මගිනි. නිදසුනක් ලෙස අප තුළ පවතින ලිංගික ආශාවන්, සතුන් මෙන් නොවී සමාජ සදාචාරයට අනුව ඉටු කර ගැනීමට උත්සාහ දරන්නේ මෙම අහංභාවය නිසාය. පෞරුෂය සතු තීරණ ගැනීමේ සාධකය මෙය යි. පෞරුෂය සතු සදාචාරමය සාධකය වන්නේ උපරි අහංභාවයයි (Super Ego) සමාජයෙන් ලද දැනුම, අත්දැකීම්,

ළමා වියේ සිට ලද සදාචාරමය උපදේශයන් මෙහි පවතින අතර ඉඩ්ගේ ආශාවන් ඉටු කිරීමට යාමේ දී Ego වෙත මෙමඟින් බලපෑම් කරයි. කාංසාව හා සංරක්ෂණ ප්‍රයෝග ෆ්‍රොයිඩ් පවසන පරිදි පුද්ගල පෞරුෂයේ සියලු ක්‍රියාකාරිත්වයන් මෙහෙය වනුයේ උක්ත බලවේග තුන හරහා ය. එසේ ම මෙම Id ගේ ආශයන් සමාජය අනුමත කරන ක්‍රමවේදයන්ට අනුව ඉටු කිරීමට යාමේ දී Ego සහ Super Ego අතර හෙවත් සමාජ සාරධර්ම සහ මානසික ආශාවන් අතර නිරන්තරයෙන් අභ්‍යන්තර ගැටුම් සිදු වන්නේ අප නොදැනුවත්වම ය. එහිදී ඉඩ් හට තම ආශාවන් ඉටු කර ගැනීමට නොහැකිව මෙවැනි මානසික ගැටුම් හා බාහිර බලපෑම් එල්ල වීම මත පුද්ගලයා කාංසාමය තත්ත්වයකට පත් වී පෞරුෂයට හානි විය හැකි ය.

මෙම ගැටුම් හා බාහිර සාධක මත ඇති වන බලාපොරොත්තු කඩවීම්වලට (ඉච්ඡාභංගත්වයට) පුද්ගලයා විවිධ උපක්‍රම යොදයි. ඒවා සංරක්ෂණ ප්‍රයෝග (Defence mechanisms) ලෙස දැක්වේ. එසේ පෞරුෂයට හානිවීම වළකාලන සංරක්ෂණ ප්‍රයෝග කිහිපයක් මෙසේය. අවරෝධනය (Repression) තමන්ට පීඩාකාරී සිතිවිලි, මතකයන් හා තමා කළ වැරදි ක්‍රියා, පිළිගත නොහැකි සිතිවිලි හෝ ආශයන් ආදිය අමතක කිරීම හෙවත් සවිඥානික සිතෙන් ඉවත් කර අවිඥානික සිතෙහි යටපත් කර තැබීම අවරෝධනයයි. නිදසුනක් ලෙස කුඩා කල සිදුවූ යම් සිදුවීමකින් වැඩිවියේ දී පෞරුෂයට හානිවීම වැළැක්වීමට එම සිදුවීම අවිඥානිකව අමතක කරයි. ප්‍රක්ෂේපණය (Projection) තමා තුළ පවතින Id ගේ ආවේගයන්, ආශාවන්, හැඟීම් හෝ අභිප්‍රේරණයන් ආදිය තමාට පමණක් නොව, අනික් අය තුළ ද පවතින බව සිතීමට හෝ වෙනත් අය වෙත හරවා දැමීමට උත්සාහ කිරීම ප්‍රක්ෂේපණයයි. එනම් අප තුළ පවතින්නා වූ වැරදි ක්‍රියාකාරකම් (නරක හෝ හොඳ) අන් අය සමඟ සැසැඳීමෙන් තමන් සාධාරණීකරණය කර ගැනීමකි. ඒවා වෙනත් අය තුළ ද දැඩි ලෙස ඇතැයි විස්වාස කරයි. මෙය ස්වයං රවටා ගැනීමක් ලෙස හැඳින්විය හැකි ය.

විතැන්කරණය (Displacement) පුද්ගලයකු තුළ ඇති වන ආවේගශීලී හැඟීම්, කෝපය ආදිය වෙනත් ඉලක්කයක් වෙත යොමු කර ඒ හරහා එම ආවේගය පිට කිරීමයි. නිදසුනක් ලෙස කාර්යාලයේ

සිදු වූ ගැටලුවක ආවේගය මත ගෙදර පැමිණ බිරිඳ සමඟ අඬදබර කිරීම දැක්විය හැකි ය. ඉන් පෞරුෂයට වන හානියෙන් වැළකෙයි. ස්වයං වින්දනය, ප්‍රදර්ශනකාමිත්වය වැනි ලිංගික චර්යාවන් ද එවැනි සංරක්ෂණ ප්‍රයෝග ලෙස ඇතමුන් පෙන්වා දෙයි. සාධාරණීකරණය (Rationalization) ඉටු කරගත නොහැකි ආශාවක් නිසා පෞරුෂයට සිදුවන හානියක් වළක්වා ගැනීම යි. මෙහිදී විවිධ අයුරින් සිතින් තර්ක කර තමන් සාධාරණීකරණය කිරීමට උත්සාහ දරයි. ප්‍රතික්‍රියා සාධනය (Reaction formation) පිළිගත නොහැකි ඉඩ්ගේ ආශාවන්ගෙන් බේරීමට ඊට හාත්පසින් ම වෙනස් අංශයකට පරිවර්තනය කිරීමයි. නිදසුනක් ලෙස බොහෝ නීති විරෝධී ක්‍රියා කරන අයෙකු තමන් ඉතා නීති ගරුක අයෙකු ලෙස සමාජයේ පෙනී සිටීමට උත්සාහ කිරීම දැක්විය හැකි ය. ප්‍රතික්ෂේප කිරීම (Denial) සැබෑ ලෝකයේ යථාර්ථයක් වුව ද තමා පිළිගැනීමට අකමැති නම්, එය ප්‍රතික්ෂේප කිරීම මෙහිදී සිදු වෙයි. නිදසුනක් ලෙස පිළිකාවක් වැනි දරුණු රෝග යක් වැළඳී ඇති අයෙක් තමාට එවැන්නක් ඇතැයි නොපිළිගනී. එය සිහිපත් කිරීම ඔහුට කාංසාමය තත්ත්වයක් ඇති වීමට හේතු වන හෙයිනි. මීට අමතර ව විවිධ බාධකයන්ගෙන් පෞරුෂයට හානිවීම වැළැක්වීම සඳහා කුඩා ළමුන්ගේ වැනි චර්යාවන් ආරෝපණය කර ගැනීම (ප්‍රතික්‍රමණය/ප්‍රතිවර්තනය) Regression, වෙනත් අයෙකුගේ චරිතයක් තමන්ට ආරෝපණය කර ගනිමින් එම හැසිරීම් අනුකරණය කිරීම (අනන්‍යකරණය) Identification වැනි සංරක්ෂණ ප්‍රයෝග දැකිය හැකි ය. මෙම ප්‍රයෝගයන් පුද්ගල පෞරුෂය මනා සමබරතාවකින් යුතුව පවත්වා ගෙන යාමට උපකාරී වන අතර සැම අයෙකු ම පාහේ නොදැනුවත්ව හෝ දැනුවත්ව එම උපායයන් අනුගමනය කරයි. එය පුද්ගලයාගේ පෞරුෂයට හානියක් නොවන අතර ප්‍රමාණය ඉක්මවා ඇතැම් ඒවාට ඇබ්බැහි වුවහොත් කාංසාමය තත්ත්වයක් හෝ මානසික රෝග දක්වා එය වර්ධනය විය හැකි ය. මනෝලිංගික අවධි හරහා පෞරුෂ සංවර්ධනය පුද්ගල පෞරුෂය ගොඩනැගීමෙහි ලා මූලික පදනම සකස් වන්නේ ළදරුවාගේ මුල් අවුරුදු පහ තුළ සිදුවන ක්‍රියාකාරකම් හරහා බව ෆ්‍රොයිඩ්ගේ අදහසයි. ඔහු පවසන පරිදි අවධි පහක් තුළ ලිංගික තෘප්තිය හෙවත් කායික තෘප්තිය කෙරෙහි යොමු වීම තුළ ළදරුවා අත්විඳින අද්දැකීම් අවිඥානික මනසෙහි තැන්පත්ව වෘද්ධ වියෙහි පෞරුෂය ගොඩනැගීමේ දී බලපෑම් කරයි. එම එක් එක්

අවධියේ දී තෘප්තිය කේන්ද්‍රගත වන කායික ස්ථාන හා ක්‍රියා පෙන්වා දෙන ෆ්‍රොයිඩ් පවසන්නේ එම අවධීන්හි දී හමුවන චර්යාවන්ට හා අභියෝගයන්ට මුහුණ දෙන ආකාරය අනුව පසු කාලීනව පෞරුෂය හැඩගැසෙන බවයි. එසේ නොමැතිව එම අවධි මනා ගැළපීමකින් තොරව ගත වුව හොත් එය ඔහුගේ පෞරුෂයේ යම් යම් ඌනතාවන් හෝ දුර්වලතාවන් ඇති වීමට හේතු වෙයි.

ෆ්‍රොයිඩ් පෙන්වා දෙන අවධි පහ අතරින් පළමුවැන්න මුඛීය අවධියයි. උපතේ සිට වසරක් පමණ වන මෙම කාලය තුළ මුඛය කේන්ද්‍ර කරගෙන තෘප්තිය ලබයි. එහිදී ළදරුවා කිරි උරා බීම (මවගෙන් හෝ සූප්පුවෙන්) ආදිය මඟින් ලබන අත්දැකීම් හා තෘප්තිය පෞරුෂය කෙරෙහි දැඩිව බලපායි. මුඛීය අවධිය කෙරෙහි වඩා සංලග්න වීමෙන් වැඩිහිටි වියේ දී දුම්පානයට නැඹුරු වීම, පමණ ඉක්මවා ආහාර ගැනීම වැනි දුර්වල පෞරුෂ ලක්ෂණ ඇති විය හැකි අතර මව දක්වන දැඩි සැලකිල්ල හා ආදරය හේතුවෙන් අසාමාන්‍ය චර්යාවන් වර්ධනය විය හැකි බව ෆ්‍රොයිඩ් පවසයි. දෙවන මනෝලිංගික අවධිය ගුදීය අවධියයි. මළපහ කිරීමෙන් මෙන් ම එය පාලනය කිරීමෙන් ද තෘප්ත වන මෙම අවධියෙහි දී දරුවා පිරිසිදුකම උගනී. ඉඩ්ගේ අවශ්‍යතාවන්ට ඍජුවම ඉඩ නොදී උපරි අහංභාවයේ බලපෑම මත එය සිදු කරන හෙයින් මානසික ඝට්ටනයක් සිදු වන අතර එම යුගය සරල ව හා නිවැරදි ව පුහුණු නොකළහොත් කාංසාමය තත්ත්වයක් ඇති විය හැකි ය. මෙම යුගය සරලව හා නිවැරදිව පසු කිරීමට නොහැකි වූවන් පසුකාලීනව රළු, අක්‍රමණශීලී චර්යා සහිත පෞරුෂ ලක්ෂණ පෙන්නුම් කළ හැකි අතර දැඩි පාලනයකින් එය හසුරුවන්නන් පසුකාලීනව ලෝභ, අතිපිරිසිදු, දැඩි විනය ගරුක චරිත ලක්ෂණ පෙන්නුම් කළ හැකි ය. තුන්වන යුගය වන ලිංග රූප අවධියේ දී කායික තෘප්තිය ලිංගේන්ද්‍රය වෙත යොමු වෙයි. මෙහිදී මව, පියා හා දරුවා අතර සම්බන්ධතාව ඉතා වැදගත් ය. පිරිමි දරුවන් තුළ ඊඩිපස් සංකීර්ණය හෙවත් මව පිළිබඳ කිසියම් ඇල්මක් ඇති වන අතර පියා පිළිබඳ කිසියම් එදිරිවාදිකමක් වර්ධනය වෙයි. ගැහැනු දරුවන් මව කෙරේ ඊර්ෂ්‍යා කරන අතර පියා කෙරේ ඇල්මක් ඇති කර ගනී. එය ඉලෙක්ට්‍රා සංකීර්ණය ලෙස ෆ්‍රොයිඩ් හැඳින්වීය. අවශ්‍යතාවට වඩා ලිංගරූප අවධියට සංලග්න වීම හේතුවෙන් ආත්මරාගී පෞරුෂ ලක්ෂණ ඇති විය හැකි ය. එහෙයින් මෙම කාලය

තුළ මව, පියා හා දරුවන් අතර පවතින යහපත් සම්බන්ධතාව මත එම මානසික ගැටලුවෙන් දරුවා බේරාගත හැකි ය. සිව්වන යුගය වන ගුප්ත අවධියේ දී පවුලෙන් ඔබ්බට ගොස් සමාජය ඇසුරු කරන අතර විරුද්ධ ලිංගිකයන්ට එළිපිට ම පාහේ වෛර සහගත බවක් පෙන්වයි. අවුරුදු 6 - 12 පමණ වන මෙම යුගයේ ශාරීරික වර්ධනය සිදු වෙයි. පස්වන අවධිය ජනනේන්ද්‍රිය අවධිය යි. වර්ධනය වූ ශරීරයක් සහිත පුද්ගලයා විරුද්ධ ලිංගිකයන් කෙරෙහි ඇල්මක් ඇති කර ගනී. සමාජ සම්බන්ධතා පවත්වමින් පෞරුෂ ලක්ෂණ දියුණු කර ගනී. ෆ්‍රොයිඩ් පවසන පරිදි මෙම මනෝලිංගික අවධීන් නිසි පරිදි සන්තෘප්ත නොවුවහොත් එහි අහිතකර ප්‍රතිඵල ලෙස පසුකාලීන ව දුර්වල පෞරුෂ ලක්ෂණ පෙන්නුම් කළ හැකි ය.

**පෞරුෂය සංවර්ධනය පිළිබඳ කාල්යුංගේ ප්‍රවේශය**

පෞරුෂ සංවර්ධනය පිළිබඳ කාල් යුංග් මනෝවිශ්ලේෂණවාදය ගුරු කොට ගත්, එහෙත් ස්වකීය මත ඔස්සේ එය දියුණු කළ මනෝවිද්‍යාඥයෙකි, කාල් යුංග්. පෞරුෂය පිළිබඳ ඔහු දැක්වූ අදහස් පිළිබඳ විමසා බැලීමේ දී පෞරුෂ වර්ග දෙකක් පිළිබඳ සංකල්පය සුවිශේෂී වෙයි. එනම්, අන්තරාවර්තී (Introvetion) සහ බහිර්වර්ති (Extravetion) යනුවෙනි. සමාජයෙහි දක්නට ලැබෙන ඇතැම් පුද්ගලයන් අතර හුදෙකලාව පැත්තකට වී සිටින චරිත දැකිය හැකි ය. ඔවුන් අන්තර්වර්තී පෞරුෂ ලක්ෂණ සහිත පුද්ගලයන් ලෙස යුංග් හඳුන්වා දෙයි. ඔවුන් බොහෝවිට තමන් තුළට ම නැඹුරු වූ චින්තනයක් සහිත, කල්පනාකාරී, බාහිර ලෝකය සමඟ සම්බන්ධ වීමට බියක් දක්වන, ලැජ්ජාශීලී, මිතුරන් ඇතිකර ගැනීමට එතරම් කැමැත්තක් නොදක්වන පෞරුෂ ලක්ෂණ පෙන්නුම් කරයි. බහිර්වර්තී පෞරුෂ ලක්ෂණ සහිත පුද්ගලයන් මිත්‍රශීලී වීමට කැමති ය. ලෝකය පිළිබඳ විවෘත දැසින් යුතු වෙයි. අනෙක් අය පිළිබඳ සැලකිලිමත් වෙයි. ඔවුහු බොහෝ සමාජශීලී, ආත්ම විශ්වාසයෙන් යුක්ත, විනෝදකාමී පුද්ගලයෝ වෙති. යුංග් අදහස් කළේ මෙම පෞරුෂ වර්ග දෙක අප සමබරව පවත්වා ගෙන යාම වඩා යෝග්‍ය බවයි.

අප වැඩි වශයෙන් අන්තරාවර්තී හෝ බහිර්වර්තී නොවී එම පෞරුෂ ලක්ෂණ ද්විත්වය ම අප වෙත පවතී නම්, මනා පෞරුෂයක්

ගොඩනගාගත හැකි ය. ෆ්‍රොයිඩියානු මත වර්ධනය කළ මොහු මනසෙහි ස්ථර තුනක් පෙන්වා දෙයි. එනම් Ego, පුද්ගලික අවිඥානය (People conscious) සහ සාමූහික අවිඥානය (Laollective conscious) යනුවෙනි. Ego යනු සවිඥානය යි. පුද්ගල අවිඥානය යනු මෙම අවස්ථාවේ සවිඥානයෙහි නොමැති එහෙත් සවිඥානයට ගෙන ආ හැකි මතකයන් ය. සාමූහික අවිඥානය යනු මානවයාගේ ආරම්භයේ පටන් මනසට ඇතුළු වූ මතකයන් ය. ඒවා ඍජුව ම සවිඥානයට නගා ගත නොහැකි අතර පෞරුෂය කෙරෙහි අවිඥානික බලපෑමක් සිදු කරයි. සාමූහික අවිඥානය පුරාකෘතවලින් (archetypes) සමන්විත වෙයි. මව, පියා, ඉර, හඳ, දෙවියා ආදි මානසික අද්දැකීම් ය. පෞරුෂය සංවර්ධනය වීමේ දී සාමූහික අවිඥානයෙහි පවතින මෙම පුරාකෘත මඟින් ද යම් බලපෑමක් සිදු කරන අතර එම මානසික චරිත ඔහුගේ අවිඥානික වීරයන් ලෙස ක්‍රියා කරයි. මෙහි ඇති සුවිශේෂී, වැදගත් පුරාකෘත දෙකක් ලෙස anima සහ animna හඳුන්වා දිය හැකිය. anima යනු පුරුෂයන් තුළ ඇති ස්ත්‍රී ලක්ෂණ සමුදායයි. animna යනු කාන්තාවන් තුළ ඇති පුරුෂ පෞරුෂ ලක්ෂණයන් ය. අප සහකරුවකු හෝ සහකාරියක සෙවීමේ දී අප පෞරුෂයේ සැඟවී ඇති මෙම ලක්ෂණ හා මනාව සැසඳෙන පුද්ගලයා සෙවීමට උත්සාහ ගන්නා බව යුංග් පවසයි. ඇල්ෆ්‍රඩ් ඇඩ්ලර්ගේ පෞරුෂ සංකල්පය ඇඩ්ලර්ගේ දැක්ම අනුව පුද්ගල පෞරුෂ වර්ධනයේ ප්‍රාථමික සාධකයන් වන්නේ ෆ්‍රොයිඩ් පැවසූ අන්දමට ලිංගිකත්වය නොව, ශ්‍රේෂ්ඨත්වයට හෙවත් උසස් බවට (Striving for Superiority) පැමිණීමට ඇති අවශ්‍යතාව හා දැඩි උත්සාහයයි. පුද්ගල පෞරුෂයේ ප්‍රධාන බලවේගය වන්නේ මෙම හැඟීමයි. ඔහු පැවසුවේ ඇතැම් පුද්ගලයන් කුඩා කල සිට ම ශරීරය කුඩාවීම් වැනි දෝෂ නිසා හටගන්නා හීනමානයන් හරහා අනෙක් අය සමඟ කටයුතු කිරීමට යාමේ දී ඔවුන් එම ශ්‍රේෂ්ඨත්වයට පත්වීමේ දැඩි හැඟීම මත හීනමානයට මුහුණ දෙන අතර ඒ හරහා පෞරුෂය වර්ධනය වන බවයි. එම උත්සාහය පමණ ඉක්මවා ගියහොත් අන්‍යයන්ට කරදර කරන රළු, බලය පෙන්වන්නෙකු හෝ පුරසාරම් දොඩමින් ආත්ම වර්ණනාවෙහි යෙදෙන පුහු අභිමානයක් මවාපාන, දුර්වල පෞරුෂ ලක්ෂණ සහිත පුද්ගලයෙකු බවට පත්විය හැකිය.

**පෞරුෂය සංවර්ධනය පිළිබඳ සමාජ ඉගෙනුම්වාදී ප්‍රවේශය**

පෞරුෂ සංවර්ධනය පිළිබඳ සමාජ ඉගෙනුම්වාදී ප්‍රවේශයේ දී ඇල්බට් බන්ඩූරා දක්වන්නේ නිරීක්ෂණාත්මක ඉගෙනීමේ දී යමෙකු තවත් පුද්ගලයෙකුගේ චර්යාවක්, පෞරුෂ ලක්ෂණයක් දෙස බලා එය අනුකරණය කොට තමන්ගේ පෞරුෂය වර්ධනය කර ගැනීම සිදු වන බවයි. බන්ඩූරා ඉදිරිපත් කළ වැදගත්ම සංකල්පය මෙයයි. ඔහු පවසන පරිදි පෞරුෂ වර්ධනයේ දී චර්යාව, පරිසරය මෙන්ම මානසික ප්‍රජානනික ක්‍රියාවලිය ද වැදගත් වෙයි. සමාජයේ ජීවත් වන අපි ඇතැම් විට අප සිත්ගත් වීර චරිත අනුකරණය කිරීමට පෙළඹෙමු. මෙහිදී විශේෂයෙන් ම තම පියා, මව, ගුරුවරුන්, සමාජයේ ශ්‍රේෂ්ඨ චරිත, උසස් ගති ඇති මිතුරන් අනුකරණය කිරීම දැකිය හැකි ය. බන්ඩූරා පවසන පරිදි මෙවැනි ඉගෙනීමේ ක්‍රමයක් මඟින් ද පුද්ගලකුගේ පෞරුෂය හැඩගැසීමේ ශක්‍යතාවක් පවතින අතර ඕනෑම අයෙකුට එසේ තම පෞරුෂය වර්ධනය කර ගත හැකි ය. මෙහිදී බොහෝදුරට අනුකරණය කෙරෙනුයේ විරුද්ධ ලිංගික චරිත නොව සමලිංගික චරිතයන් ය.

බන්ඩූරා ඉදිරිපත් කළ වැදගත් ම පෞරුෂ වර්ධන සංකල්පය නම් ස්වයං සඵලත්වය (Sefl efficacy) පිළිබඳ සංකල්පය යි. ස්වයං සඵලත්වය යනු අපේක්ෂිත ප්‍රතිඵලය ළඟා කර ගැනීම සඳහා තමාට කටයුතු කළ හැකි ය යන විස්වාසය පුද්ගලයකු තුළ වර්ධනය වී තිබීම යි. අප යමක් සිදු කළ ද එය පිළිබඳ ආත්ම විශ්වාසය නොමැති වූ විට එහි ප්‍රතිඵල අවම වෙයි. එහෙයින් තමන්ට හැකිය යන ආත්ම විශ්වාසය උසස් පෞරුෂ ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකි ය. අභියෝගවලට මුහුණ දීමේ දී ආත්ම විශ්වාසය හා ස්වයං සඵලත්වය ඉතා වැදගත් වෙයි. එසේම අපගේ හැසිරීම පිළිබඳ අප විසින්ම නිරීක්ෂණය කර ආත්ම ප්‍රශංසනයෙන් හෝ ස්වයං දඬුවම් ක්‍රමයක් මඟින් ද දුර්වල පෞරුෂ ලක්ෂණ බැහැර කර උසස්, යහපත් පෞරුෂ ලක්ෂණ වර්ධනය කර ගත හැකි බව බන්ඩූරා පෙන්වා දෙයි. එය ස්වයං යාමනය (Sefl regulation) නමින් ඔහු හැඳින්වීය. අභ්‍යන්තර පාලන කේන්ද්‍රියත්වය (loc fo control) හා බාහිර පාලන කේන්ද්‍රියත්වය පිළිබඳ සංකල්පය ද පුද්ගල පෞරුෂය සම්බන්ධව වැදගත් වෙයි. අභ්‍යන්තර පාලන කේන්ද්‍රීය චින්තනයක් ඇති පුද්ගලයා තමා පිළිබඳ

විශ්වාස කරන අතර බාහිර පාලන කේන්ද්‍රීය චින්තනයක් සහිත පුද්ගලයා තමාට සිදුවන දේවල් වාසනාව, ඉරණම, දෛවය හෝ අන්‍යයන් මත රඳා පවතින බව විශ්වාස කරයි. මින් අභ්‍යන්තර පාලන කේන්ද්‍රීයත්වයක් සහිත පුද්ගලයා තුළ මනා පෞරුෂයක් පවතින බව පැවසිය හැකි ය. ඔහු ධනාත්මක චින්තනයකින් යුක්ත වෙයි.

**පෞරුෂය සංවර්ධනය පිළිබඳ පුද්ගල කේන්ද්‍රීය ප්‍රවේශය**

මානවවාදී ඇසින් පෞරුෂය කාල් රොජර්ස්ගේ පුද්ගල කේන්ද්‍රීය න්‍යාය රොජර්ස්ගේ න්‍යාය තුළ ඉතා වැදගත් හා ප්‍රමුඛ කොට සැලකෙනුයේ ස්ව-සංකල්පය හෙවත් 'Self' යන්නයි. ස්ව සංකල්පය යනු යම් පුද්ගලයකු තමන් පිළිබඳ ඇති කර ගන්නා ආත්ම සංජානනය යි. එනම් අප තුළ, අප පිළිබඳ පවතින්නා වූ මානසික චිත්‍රයයි. ස්ව සංකල්පය හෙවත් පුද්ගලයා තුළ පවතින තමා පිළිබඳ දෘෂ්ටිය ආත්මීය බව හේතු කොට ගෙන සැම විට ම නිවැරදි විය නොහැකි ය. එනම්, බොහෝ පුද්ගලයන් තමා පිළිබඳ ඇති කර ගෙන පවතින ආත්ම සංජානනය යථාර්ථය සමඟ සලකා බැලීමේ දී නිවැරදි නොවිය හැකි ය. මන්ද යත්, අප අපගේ වැරදි සඟවා ගනිමින් පරිපූර්ණ ලෙස නිවැරදි පුද්ගලයකු මෙන් සමාජයේ පෙනී සිටීමට නිරන්තර වෑයමක යෙදී සිටින හෙයිනි. එහිදී අප විසින් අපගේ දුර්වල පෞරුෂ ලක්ෂණයන්, වැරදි ක්‍රියා හා දුර්ගුණයන් ආදිය අන්‍යයන්ගෙන් සැඟවීමට උත්සාහ කරනු ලබයි. උසස් යැයි හැඟෙන ලක්ෂණ පමණක් සමාජයට විවෘත කෙරෙයි. එමගින් අප වෙතින් ඉස්මතු වන්නේ යථාරූපී ස්වසංජානනයක් නොවේ. සැම පුද්ගලයෙකුගේ ම චරිතයන් තුළ මෙවැනි සාවද්‍ය වූ ආත්ම සංජානනයක් පැවතිය හැකි අතර යථාර්ථය හා ඔහුගේ ස්ව සංකල්පය අතර පවතින්නා වූ අසමානතාව, විසදෘශතාව (Incongruence) ලෙස රොජර්ස් පෙන්වා දෙයි. එනමුත් ප්‍රශ්නය වනුයේ මෙම විසදෘශතාව වැඩිවන විට පුද්ගලයාගේ මනෝවිද්‍යාත්මක යහපැවැත්වම දුර්වල විය හැකි අතර එය පෞරුෂයට ද හානියකි.

කාල් රොජර්ස්ගේ අර්ථකථනය අනුව පුද්ගල පෞරුෂ ව්‍යුහය ශක්තිමත් කිරීමේ වැදගත් ම සාධකය වන්නේ ස්ව සංකල්පය යි. කෙසේ වෙතත් පෞරුෂය ගොඩනැගීමේ දී කුඩා කාලයේ දී ලැබූ

අත්දැකීම් අනුව සාදෘශ්‍යතාව හෝ විසදෘශ්‍යතාව වර්ධනය විය හැකි ය. කුඩා කාලයේ දී දෙමාපියන් විසින් දරුවන්ට නිසි ආදරය, සෙනෙහස, රැකවරණය ලබා දිය යුතු ය. එම අවශ්‍යතාවන් ඉටු නොවූ විට මෙන්ම නීති රීති යටතේ ජීවත් වීමට සිදු වීම තුළ ද ඔහුගේ ස්ව සංකල්පයට බලපෑම් කළ හැකි ය. දරුවන් හදා වඩා ගැනීමේ දී ආදරය, සෙනෙහස, රැකවරණය ලබා දීමෙන් ඔවුන්ගේ පෞරුෂය, ස්ව සංකල්පය වර්ධනය කළ හැකි ය. එසේ ම කුඩා කාලයේ දී ඇති වන සෘණාත්මක අත්දැකීම්වල බලපෑම වැඩිහිටි විය දක්වාම පැතිර යා හැකි ය. එවිට බලාපොරොත්තු කඩවීම්, අන් අයට නිතරම යටත් වීම් හෝ ගැටුම්කාරී බව ආදි විවිධ ක්‍රමවලින් ඒවා එළියට පැමිණිය හැකි බව රොජර්ස්ගේ අදහසයි. එහෙයින් අපගේ පෞරුෂය වර්ධනය කර ගැනීමට නිතරම අන් අයට යටත්ව සිටීමෙන් වැළකිය යුතු ය. තමා පිළිබඳ, තම හැකියාවන් පිළිබඳ නිවැරදි අවබෝධයක් පැවතිය යුතු ය. එසේම, යථාර්ථ ලෝකය තුළ ක්‍රියා කිරීමේ දී ධනාත්මක අත්දැකීම්වලට වැඩි වශයෙන් නැඹුරු විය යුතු ය. එසේම අප යමෙකු ධනාත්මක අයුරින් අගය කරන විට, අනුකම්පා සහගත වීම, හා අව්‍යාජත්වය තුළින් ඔවුන්ගේ ස්වීයත්වය වර්ධනය කළ හැකි ය.

**පෞරුෂ සංවර්ධනය පිළිබඳ ඒබ්‍රහම් මාස්ලෝගේ ආත්ම සාක්ෂාත්කරණය**

මාස්ලෝ ද පුද්ගල ශක්‍යතාවට, ස්වීයත්වයට ප්‍රමුඛත්වයක් ලබා දුන් මානවවාදී මනෝවිද්‍යාඥයෙකි. ඔහු පෙන්වා දෙන අවශ්‍යතා ධුරාවලියෙහි

1. ආහාර, ඇඳුම්, නිවාස ආදි කායික අවශ්‍යතා,
2. ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතාව,
3. මිත්‍රත්වය, ආදරය වැනි සාමාජීය අවශ්‍යතා,
4. ගරුත්වය, පිළිගැනීම වැනි සම්මානනීය අවශ්‍යතා,
5. හැකියාවන්ගෙන් ඉහළම තලයකට පත්වීම හෙවත් ආත්ම සාක්ෂාත්කරණය

යනුවෙන් මිනිස් අවශ්‍යතාවන් පහක ධුරාවලියක් මොහු පෙන්වා දෙයි. ඉහළ ම තලය වන ආත්ම සාක්ෂාත්කරණයට පත්වීමේ අවශ්‍යතාව පුද්ගල පෞරුෂයේ වැදගත් ම සාධකයයි. ඔහු නිරෝගී පෞරුෂයක් ලෙස පෙන්වා දුන්නේ මෙම ආත්ම සාක්ෂාත්කරණයට පත්වූ චරිතයන් ය. සරල බව, යථාර්ථය පිළිබඳ පැහැදිලි අවබෝධය, ස්වතන්ත්‍ර බව, ඉහළ ආත්ම තෘප්තියකින් යුක්ත වීම, ප්‍රබල මිත්‍ර සම්බන්ධතා පැවැත්වීම, ක්‍රියාශීලී බව, සත්‍ය ප්‍රියබව හා පෞරුෂයේ අන්තගාමී නොවීම ආදිය නිරෝගි පෞරුෂයක් සහිත ආත්ම සාක්ෂාත්කරණයට පත් පුද්ගලයකුගේ චරිත ලක්ෂණ කිහිපයකි. මහා පෞරුෂ සාධක පුද්ගලයකුගේ පෞරුෂයක පැවතිය යුතු ප්‍රධාන සාධක මොනවාදැයි පර්යේෂණ කරන ලද මනෝවිද්‍යාඥයන් විසින් නිරෝගි පෞරුෂයකින් හෙබි පුද්ගලයකු තුළ පැවතිය යුතු ප්‍රමුඛ ලක්ෂණ පහක් පෙන්වා දී ඇත.

1. විවෘත බව (Openness)
2. හෘද සාක්ෂ්‍යයට එකඟ බව (Laocientionaness)
3. බහිර්වර්තී බව (Extravetion)
4. එකඟ බව (Agreeableness)
5. නියුරෝෂීය බව / චිත්තවේගික ස්ථාවරත්වය (Neurotisism/ Emotional Stability) යන පහයි.

බොහෝ පර්යේෂකයන් මේවා පොදු ගති ලක්ෂණ ලෙස පිළිගත්ත ද ඇතමුන් එය ප්‍රතික්ෂේප කරන අතර එවැනි පහක් මඟින් පමණක් අපගේ පෞරුෂය පිළිබඳ විග්‍රහ කළ නොහැකි බව ඔවුහු පෙන්වා දෙති. පෞරුෂය හා සමාජය පුද්ගලයා යනු සාමාජීය සත්ත්වයෙකි. එහෙයින් ඔහුගේ සෑම චර්යාවක් කෙරෙහි ම සමාජය ඍජුවම බලපෑම් කරන බව නොකිව මනාය. පුද්ගල පෞරුෂ සංවර්ධනයෙහි ලා විශේෂයෙන්ම ඉවහල් වන්නේ ඔහු වර්ධනය වන සමාජ පරිසරයයි. විවිධ මනෝවිද්‍යාඥයන්ගේ හා සමාජ විද්‍යාඥයන්ගේ මතවාදයන් විමසා බැලීමෙන් ඒ බව පැහැදිලි වෙයි.

පුද්ගලයකුගේ පෞරුෂය කෙරෙහි බලපාන වැදගත් ම සමාජ ඒකකය වනුයේ පවුල යි. පවුල තුළ දී ඔහුට අත්දැකීමට හා ප්‍රතිචාර දැක්වීමට සිදු වන පරිසරය ඉතා යහපත් නම්, ඔහු තුළ මනා පෞරුෂයක් වර්ධනය විය හැකි ය. විශේෂයෙන් ම මෙහිදී මව හා පියා ඉතා කල්පනාකාරීව දරුවා සමග සබඳතා පැවැත්විය යුතු ය. ෆ්‍රොයිඩ් පෙන්වා දුන් අන්දමින් ඔහුගේ ළමා කාලය කිසිඳු ඝට්ටනයකින් තොරව ගලා යාමට සලස්වන්නේ නම් ඉතා යහපත් වෙයි. එසේම පවුල තුළ අනෙක් සහෝදර සහෝදරියන් සමඟ සබැඳියාව ද ඉතා වැදගත් වෙයි. එමෙන් ම පළමුව උපදින දරුවා හා පසුව උපදින දරුවා වෙත දක්වන සැලකිල්ල හා බාලම දරුවා කෙරෙහි දක්වන සැලකිල්ල සමාන විය යුතු ය. ඇතැම් විට පවුලේ වැඩිමහල් දරුවාට සියලු සැලකිල්ල ලැබී තිබිය දී, අලුත් සාමාජිකයකු ඇතුළත් වීමත් සමඟ එය නැතිවී ගියහොත් මානසික වියවුලකට පත්වීම තුළ පෞරුෂයට හානියක් විය හැකි ය. ක්‍රමයෙන් වැඩිවියට පත් වන ළදරුවා ඇසුරු කරන මිතුරන්, වැඩිහිටියන් ඔවුන් තුළින් ලබන අත්දැකීම් ද පෞරුෂය කෙරෙහි බලපායි. මෙම කාලය තුළ දී දරුවා නිසි ගුරුවරයෙකුගේ මඟ පෙන්වීම යටතේ වර්ධනය වන්නේ නම් ඔහු තුළින් ආක්‍රමණශීලි නොවන සමාජශීලි පෞරුෂ ලක්ෂණ වර්ධනය විය හැකි ය. පුද්ගල පෞරුෂයේ වැදගත් සාධකයක් ලෙස මානවවාදීන් පෙන්වා දෙන ස්ව සංකල්පය වර්ධනය සඳහා සමාජ ඝට්ටනයන් පිළිබඳ අත්දැකීම් බලපෑ හැකි ය. ඇතැම් විට සමාජයෙන් බොහෝ පීඩා විඳ හැලහැප්පීම්වලට ලක්වූ පුද්ගලයකු කෙසේ හෝ ආත්ම ධෛර්යයෙන් ආත්ම සාක්ෂාත්කරණ තත්ත්වයට පත්වීමට උත්සාහ කළ හැකි ය. එහිදී ඔහුගේ ආත්ම විස්වාසය, ශ්‍රේෂ්ඨත්වයට පත්වීමේ අවශ්‍යතාව ඉතා ඉහළ මට්ටමක පවතියි. සමාජය සේම ඒ හා බැඳුණු සංස්කෘතිය ද පෞරුෂ සංවර්ධනයෙහි ලා බලපෑම් කරයි. මන්ද යත්, පුද්ගලයා තුළ සදාචාරවත් ගුණ ධර්ම සහිත සංවේදී පෞරුෂ ලක්ෂණ වර්ධනය වීමට ආගම හා සංස්කෘතියෙන් එල්ලවන්නා වූ බලපෑම හේතුවෙනි. පුද්ගල පෞරුෂය යනු කුඩා කාලයේ දී පමණක් සකස් වන්නක් නොවෙයි. කුඩා අවධියේ වැටුණු පදනම මූලික කර ගෙන වැඩිහිටි විය දක්වාම සමාජය ඇසුරින් ලබන අත්දැකීම් හරහා ස්වකීය පෞරුෂ ලක්ෂණයන් වර්ධනය කර ගනිමින් සකස් කරගත හැකි ය. විශේෂයෙන් ම පුද්ගල විෂමතාවන් අනුව එක්

එක් පුද්ගලයා නිරූපණය කරන සමාජ භූමිකාවට අනුව හැඩගැසීමේ දී ද ඔහුගේ පෞරුෂයට තවත් නව ලක්ෂණයන් ඒකරාශී වෙමින් වර්ධනය විය හැකි ය. කෙසේ වෙතත් එය සිදු වන්නේ කුඩා කල සිට ඔහු තුළ වර්ධනය වූ පෞරුෂ ලක්ෂණ කේන්ද්‍ර කරගෙන ය. නිදසුනක් ලෙස ඔහු තෝරා ගන්නා රැකියාවට අනුව ඇතැම් පෞරුෂ ලක්ෂණ වෙනස් වීමට හෝ වර්ධනය වීමට හැකි ය. එමෙන් ම පුද්ගලයා සමාජය තුළ ජීවන වෘත්තියක් හෙවත් රැකියාවක් තෝරා ගැනීමේ දී ද විශේෂයෙන්ම පෞරුෂය බලපායි. බොහෝ දුරට බොහෝ පුද්ගලයන් රැකියාවකට යොමු වන්නේ ඔහු තුළ පවතින්නා වූ පෞරුෂ ලක්ෂණ අනුව යැයි පැවසිය හැකි ය. එනම්, එය අවිඥානික බලපෑමකි.

නිදසුනක් ලෙස පරිපාලන නිලධාරියෙකු ලෙස රැකියාවකට යමෙකු යොමු වන්නේ ඔහු තුළ කුඩා අවධියේ සිට ඊට සමගාමී පෞරුෂ ලක්ෂණ වර්ධනය වී ඇති හෙයිනි. විවිධ පුද්ගලයන් විවිධ රැකියාවන්ට යොමුවන්නේ මේ හේතුවෙනි. පුද්ගල පෞරුෂය යනු විද්‍යාවේ හා සමාජ පරිසරයේ අන්‍යෝන්‍යකාරක නිපැයුමකි. පුද්ගලයා යහපත්, උසස් පෞරුෂයකින් හෙබි පුද්ගලයකු වීමට ඔහු ජීවත් වන සමාජ පරිසරය හේතු වෙයි. යහපත් පවුල් පරිසරයක් හා සමාජ වටපිටාවක්, පුද්ගල ඇසුරක් සහිත වූ විට ඔහුගේ පෞරුෂය ද උසස් වෙයි.

සමාජයක ශිෂ්ට සම්පන්න අගයයන් පවත්වා ගෙන යාම සඳහා අධ්‍යාපන ක්‍රියාවලිය හුදෙක් ම විෂය කරුණු පිළිබඳ දැනුම ලබා දීමට වඩා ඉන් ඔබ්බට යා යුතුව ඇත. සෑම පුද්ගලයෙකු ම තමන් එම සමාජයේ ඵලදායි පුද්ගලයෙකු යැයි අවබෝධ කර ගෙන සිටීම පුද්ගලයාගේ පෞරුෂ වර්ධනය සඳහා බෙහෙවින් අවශ්‍ය වේ. ශිෂ්‍යයන්ගේ ස්ව සංකල්පය ප්‍රතිජානාත්මක ස්ව සංකල්පයක් ලෙස වර්ධනය වීම, ඔවුන්ගේ ශිෂ්‍ය පෞරුෂ සංවර්ධනය හා සමාජ සංවර්ධනය සඳහා බෙහෙවින් බලපායි. පුද්ගල පෞරුෂ සංවර්ධනයේ දී විෂය ඥානය වර්ධනය සඳහා මෙන් ම මෙම ක්ෂේත්‍ර සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු බව මෑත කාලයේ දී වඩ වඩා අවධාරණය කෙරෙමින් පවතී.

විභාග සමත්වීම පමණක් අපේක්ෂා කිරීම නිසා පෞරුෂ සංවර්ධනය කෙරෙහි ඇත්තේ උදාසීන බවකි. එහෙත් සෑම පාසලක්

ම හා ගුරුවරයකු ම ළමයින්ගේ පෞරුෂ වර්ධනය කෙරෙහි වගකිව යුතු වේ. සෑම පාසලක් ම ශිෂ්‍ය අවශ්‍යතා කෙරෙහි උනන්දුවක් දක්වා ඔවුනගේ පෞරුෂය වර්ධනය කරලීමට අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය සාධකය වන්නේ ය. එංගලන්තයේ ජාතික විෂයමාලා කමිටුව සිය වාර්තාවේ සඳහන් කර ඇත්තේ පුද්ගල හා සමාජ කුසලතා අධ්‍යාපනය විෂයමාලාව පුරාම තිරස්ව ක්‍රියාත්මක විය යුතු බවත් පුද්ගල පෞරුෂය හා සමාජ කුසලතා වර්ධනය හුදෙක් ඉබේ සිදුවන්නේ යැයි බලා නොසිට ඒ සඳහා කිසියම් සැලසුම් සහගත හා සංවිධානාත්මක වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතු බවයි.

**සමාලෝචනය**

Persona (වෙස් මුහුණ) යන ග්‍රීක වචනයෙන් බිඳී ආ Peresonality (පෞරුෂය) යන්න පිළිබඳ විවිධ විවරණයන් විද්‍යාව තුළ පවතී. පොදුවේ ගත් කල පුද්ගලයකුගේ පෞරුෂය කෙසේ සංවර්ධනය වන්නේදැයි මෙහිදී සාකච්ඡාවට ලක් කළේ මනෝවිද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක න්‍යායයන්ට අනුව ය. පුද්ගලයකුගේ පෞරුෂ සංවර්ධනය ගොඩ නැගෙන්නේ කුඩා අවධියේ පුද්ගලයා ලබන අත්දැකීම් හා උත්තේජයන්ගේ මූලික බලපෑම මත බව උක්ත කරුණු මඟින් පෙන්වා දුනි. එමෙන් ම ඒ හා බැඳුණු අනික් කාරණය වන්නේ සාමාජීය පරිසරය යි. එපමණක් නොව පෞරුෂය යනු එම පදනම මත පිහිටා දිනෙන් දින ලබන අත්දැකීම් හරහා වර්ධනය වන්නක් ලෙස ද පෙන්වා දිය හැකි ය. පුද්ගලයකුට පෞරුෂ ගති ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීම, අවබෝධයකින් යුක්ත වීම ප්‍රායෝගික වටිනාකමකින් යුක්ත වෙයි. මන්ද යත්, තමාට තමාව හඳුනා ගැනීමටත් ඒ තුළින් තමන් සමාජය සමඟ කෙතරම් සාර්ථක ලෙස සම්බන්ධ වී ඇද්දැයි වටහා ගැනීමටත් හැකියාව ලැබෙයි. එසේ ම, අප සිතන පතන ආකාරය, තමන් යොමු විය යුතු වෘත්තීය තත්ත්වය ආදිය පිළිබඳ ස්වයං තක්සේරුවක් ඇති කර ගත හැකි ය. එපමණක් නොව, තම පෞරුෂය තුළ පවතින දුර්වලතාවන් මඟහරවා ගනිමින් ආත්ම විශ්වාසයෙන් යුතු, ශක්තිමත් පෞරුෂයකින් හෙබි පුද්ගලයකු ලෙස සමාජයට මුහුණ දීම සඳහා එම අවබෝධය උපකාරී වේ යැයි නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අතුකෝරල, දයාරෝහණ. (2000). *අධ්‍යාපන මනෝවිද්‍යාව හා ගුරුවරයා.* කොළඹ 08: ශික්ෂා මන්දිර ප්‍රකාශන.

අබේපාල, රෝලන්ඩ්. (2015). *අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම.* කොට්ටාව: සාර ප්‍රකාශන.

අමරසේකර, දයා. (1980). *සමාජ විද්‍යාව සරල ශාස්ත්‍රීය ලිපි.* වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ.

කාරියවසම්, යූ, ජී, පි. (1956). *අධ්‍යාපනික මනෝවිද්‍යා ප්‍රවේශය.* ගාල්ල: ඇල්බියන් මුද්‍රණාලය.

ජයසේන, අසෝකා. (2010). *අධ්‍යාපන සමාජ විද්‍යාව.* කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

තෙන්නකෝන්, එස්, කේ. (1996). *අධ්‍යාපන මනෝවිද්‍යාව.* කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

බණ්ඩාරනායක, අභය. (1999). *මනෝවිද්‍යා ප්‍රවේශය.* කොට්ටාව: සාර ප්‍රකාශන.

විදානගමගේ, කුලසේන සහ රුවන්දිකා, චාමලී. (2010). *පෞරුෂය සහ පෞරුෂ සංවර්ධනය.* කඩවත: ජයවි ප්‍රින්ටර්ස්.

වීරසිංහ, හෙන්රි. (1992). *අධ්‍යාපන චින්තනය.* සරසවි ප්‍රකාශකයෝ.

හෙට්ටිආරච්චි, කුමාරදාස. (1999). *අධ්‍යාපන සංවර්ධනය.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.